# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2361/32 – 2023 දෙසැම්බර් මස 07 වැනි බ්‍රහස්පතින්දා – 2023.12.07

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම්, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, ඒවා ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, සංචාරක හා ඉඩම් අමාත්‍ය, නාලක ජූඩ් හරින් ප්‍රනාන්දු වන මම මෙයින් ප්‍රකාශ කරමි.

සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, අයගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කුකුළු කෝරලේ පල්ලෙපත්තුව සුළු කොට්ඨාසයේ, පරගල (අ.ග.පි. 224) හා උඩුගල (අ.ග.පි. 239) ගම්වල පිහිටි සර්වේයර් ජනරාල්ගේ අංක R/AYG/2021/26 හා 2022.06.28 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සවිස්තරව දැක්වෙන පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණයන්ගෙන් යුක්ත ඉඩම් කැබලිවලට මායිම්:

01. කැබලි අක්ෂර 'ඒ' – ගල්අමුණගාවහේනෙවත්ත – ප්‍රමාණය: හෙක්. 0.0062

උතුරට: උඩුගල විද්‍යාලය භුක්ති විඳින ගල්අමුණගාවහේනෙවත්ත; නැගෙනහිරට: මාර්ගය (මාර්ග සංවර්ධන අධිකාරිය); දකුණට: මාර්ගය (මාර්ග සංවර්ධන අධිකාරිය); බටහිරට: උඩුගල විද්‍යාලය භුක්ති විඳින ගල්අමුණගාවහේනෙවත්ත.

02. කැබලි අක්ෂර 'බී' – ගල්අමුණගාවහේනෙවත්ත – ප්‍රමාණය: හෙක්. 0.0017

උතුරට: උඩුගල විද්‍යාලය භුක්ති විඳින ගල්අමුණගාවහේනෙවත්ත සහ ගල්අමුණෙ දොළ; නැගෙනහිරට: ගල්අමුණෙදොළ සහ මාර්ගය (මාර්ග සංවර්ධන අධිකාරිය); දකුණට: මාර්ගය (මාර්ග සංවර්ධන අධිකාරිය); බටහිරට: උඩුගල විද්‍යාලය භුක්ති විඳින ගල්අමුණගාවහේනෙවත්ත.

1A – PG6560 – 14 (2023/12)

03. **කැබලි අක්ෂර 'සී' – ගල්අමුණගාවඹිකන්ද හෙවත් හොරවකන්දෙහේන – ප්‍රමාණය: හෙක්. 0.0268**

උතුරට: මාර්ගය (මාර්ග සංවර්ධන අධිකාරිය) සහ ගල්අමුණෙ දොළ; නැගෙනහිරට: ගල්අමුණෙ දොළ; දකුණට: උඩුගල විද්‍යාලය භුක්ති විඳින ගල්අමුණගාවඹිකන්ද හෙවත් හොරවකන්දෙහේන; බටහිරට: මාර්ගය (මාර්ග සංවර්ධන අධිකාරිය).

04. **කැබලි අක්ෂර 'ඩී' – නාගහඹිවිට – ප්‍රමාණය: හෙක්. 0.0410**

උතුරට: මාර්ගය (මාර්ග සංවර්ධන අධිකාරිය); නැගෙනහිරට: මාර්ගය (මාර්ග සංවර්ධන අධිකාරිය) සහ එස්. එච්. ඊටිං අප්පුහාමි හිමිකම් කියන නාගහඹිවිට; දකුණට: එස්. එච්. ඊටිං අප්පුහාමි හිමිකම් කියන නාගහඹිවිට; බටහිරට: ගල්අමුණෙ දොළ.

05. **කැබලි අක්ෂර 'ඊ' – මිෂෙල් වත්ත – ප්‍රමාණය: හෙක්. 0.0037**

උතුරට: සදාහරිත පුද්ගලික සමාගම හිමිකම් කියන මිෂෙල් වත්ත; නැගෙනහිරට: සදාහරිත පුද්ගලික සමාගම හිමිකම් කියන මිෂෙල් වත්ත; දකුණට: මාර්ගය (මාර්ග සංවර්ධන අධිකාරිය); බටහිරට: මාර්ගය (මාර්ග සංවර්ධන අධිකාරිය).

හරින් ප්‍රනාන්දු,
සංචාරක හා ඉඩම් අමාත්‍ය.

මගේ අංකය: 4 -3/6/2019/එච්ඩබ්ලිව්/397.
2023 ඔක්තෝබර් මස 10 වැනි දින.
සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය,
"මිහිකත මැදුර",
අංක 1200/6,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

EOG 12 - 0079